# Living the LOTUS

## Buddhism in Everyday Life

2 2020

VOL. 173


## Founder's Essay

# සත්‍ය වූ ධර්මයේ ආශිර්වාදය ලබා ගන්න

අපගේ හදවත පාරිශුද්ධත්වයට පත්වන විට, මේ ලෝකයම 'බුදු බිම යහතින් වැජඹේ, යුතුව දෙවි මිනිසුන්' ගෙන් පිරුණු තැනක් බවට පත්වන බව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ 16 වන පරිච්ඡේදය වන 'තථාගතයන් වහන්සේගේ සදාතනික ජීවිතය පිළිබඳ විවරණයෙ' හි දේශනා කර ඇත. නමුත් අපි හදවතේ පාරිශුද්ධත්වය ඇති කර නොගෙන, සමාජයේ තිබෙන නොයෙකුත් වැරදි හා අඩුපාඩු දෙස බලමින් සිටියි. වැදගත්වන්නේ අවට තිබෙන කුණු දෙස බැලීමට පෙර, තම හදවතේ තිබෙන කුණු ඉවත්කර ගැනීමට කටයුතු කිරීමයි.

'සත්‍ය වූ ධර්මය හඬනගා කියන්නේ නම්, අපගේ බුද්ධ ශක්තියද අනිවාර්යයෙන්ම මතුවේ' ලෙස නිචිරෙන් ෂෝනින් තුමා පවසා ඇත. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල විශාල බුදුවරු පිරිසකගේ හා විශාල බෝධිසත්වයන් පිරිසකගේ ප්‍රාර්ථනයන් මෙන්ම, ගණනය කළ නොහැකි මනුෂ්‍යයන් පිරිසකගේ ප්‍රාර්ථනයන්ද ගැබ්වී ඇත. එම නිසා දිනපතා උදේ හා සවස සූත්‍ර සජ්ඣායනය කිරීම තුලින් තම හදවත ක්‍රමක් ක්‍රමයෙන් පවිත්‍ර වේ. ඒ තුලින් 'හරිම කරදරයක්' නේ, ලෙසින් සිතාගෙන සිටි පුද්ගලයන් පවා එසේ නොවන බව පෙනී, ඒ බව වටහා නොගත් තමා ගැන වේදනාවක් දැනේවී.

මියේ ප්‍රදේශයේ, කුවනා ධර්ම ශාඛාවේ සාමාජිකයෙක් මේ ආකාරයේ සෙප්පෝවක් පැවැත්වූහ. දයිසෙයිදෝවේ ස්වේච්ඡාවෙන් පිරිසිදු කිරීමේ කටයුතු වලට පැමිණ, හද පත්ලම පිරිසිදු කිරීමේ කටයුතු සිදුකලා යන හැඟීමට පත්වූ විට බුදුන් වහන්සේ මා වෙත සිනහා පානවා සේ දැනුනී. 'මේ දක්වා මගේ දෑස නොපැහැදිලි වළාවලින් වැසී තිබුණ නිසා බුදුන් වහන්සේගේ නියම ස්වරූපය හා අන්‍යන්ගේ අලංකාරවත් ස්වරූපය නොපෙනුනා' සේ අවබෝධ කර ගැනීමට හැකිවූ බව පැවසූහ.

*Kaiso Suikan* 9, P. 156-157


**Living the Lotus**
**Vol. 173 (February 2020)**

Senior Editor: Koichi Saito
Editor: Kensuke Osada
Copy Editor: P.A.D. Somapala, Ruklanthi Palipana, Sahan Chamara

Living the Lotus is published monthly by Rissho Kosei-kai International,


Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



President's Message

# ජීවිතයේ අරමුණ සොයා ගනිමු

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## ඔබත් මිය යනවා!

පෙවරවාරි මාසය යනු, ජපානය බුදුන් වහන්සේගේ පරිණිර්වානය සමරන මාසයයි. පෙවරවාරි මස 15 වන දින පරිණිර්වානය සිදු වුනා යැයි විශ්වාස කරන බැවින් එදිනට බෞද්ධයෝ බුදුන් වහන්සේගේ ගුණ ගයමින්, බුදු දහම තවත් හොඳින් අවබෝධ කර ගැනීමට කටයුතු කරයි. එසේනම්, එම පරිණිර්වානය තුලින් බුදුන් වහන්සේ අපිට දුන් පණිවුඩය කුමක්ද?

'ජීවයක් ලබන සෑම සියළුදෙයම, කවදා හෝ අනිවාර්යයෙන්ම මරණයට ළඟා වේ.' යන යථාර්තය උන් වහන්සේ විසින් පෙන්වා දුන්නා යැයි මම සිතමි.

ඉපදීම හා මරණය එකම කට්ටලයක් වනවා සේම, 'කාසියක දෙපැත්ත වැනිය'. ඉපදීමක් තිබෙනවා නම්, මරණයකුත් තිබේ, එයයි අපගේ 'ජීවිතය'. කරුණු එසේ වුවත්, අපි 'මරණය' භාර ගැනීමට අකැමැතිය. විශාල පිරිසකට 'මරණය' බිය ජනක වනවාසේම, එයින් පළායාමටද උත්සහ කරයි. එමනිසා 'ඔබත් මිය යනවා' යන මෙලොවෙහි යථාර්තය, බුදුන් වහන්සේ විසින් තම ශරිරය භාවිතා කරමින් අපට පෙන්වා දුන්නා යැයි සිතමි.

නමුත් බුදුන් වහන්සේ තම පරිණිර්වාය තුලින් අපට කියා දෙන්නේ එය පමණක් නොවේ. ඉපදුනොත් මැරෙනවා සේම, මැරුණොත් නැවත උපතක් ලබනවා යන 'ජීවයේ' ගලායෑම තුලින්, අපි මනුෂ්‍යයෙකු ලෙස මෙලොවට ඉපිදීමේ අරුථද කියාදෙනවා යැයි සිතමි. මන්ද, අපි කවුරුත් මිය යාම සඳහා මේ ලෝකයට බිහිවී පැමිණියේ නැති නිසාය.

සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ, 'ධර්මාචාර්යතුමෙක' යන 10 වන පරිච්ඡේදය වන පරිච්ඡේදයේ 'ඔවුන් තුල දුක් විඳින සත්වයන් කෙරෙහි තිබෙන අප්‍රමාණ කරුණාව නිසා මෙලොව උපත ලබා ඇති බැවිනි' සේ සඳහන් වේ. මෙහි අරුථ ලෙස, ප්‍රශ්න ගැටළු වලින් පීඩාවට පත්ව සිටින මනුෂ්‍යයන්ව දැක, බුදුන් වහන්සේ මේ ලොවට පහල වු බවට පිළිගත හැකිය. එසේ කරන්නේ බුදුන් වහන්සේ පමණක් නොවේ. එම කරුණ ගැන මීළඟට, අපගේ ජීවත් වීම අරමුණ තුලින් කල්පනා කර බලමු.

## ජීවිතයේ අරුථ යනු

'ධර්මාචාර්යතුමෙක' යන 10 වන පරිච්ඡේදයේම 'ඔවුන් සත්වයන් කෙරෙහි පැතිරුණු කරුණාවෙන්, ප්‍රාර්ථනා කර මේ මිනිස් ලොව ඉපිද' සේ සඳහන් වේ. දුක් වේදනාවල් වලින් බහුල මෙලොවට, අපි ප්‍රාර්ථනා කරගෙන මනුෂ්‍යයෙකු ලෙස ඉපදුන බවයි එහි සඳහන් වන්නේ. තවත් ආකාරයකට පවසනවා නම්, දුක් වේදනාවන් තිබුණත්, සතුටුදායක දේත් මෙම ලෝකය තුල තිබෙනවා. ඒ තුලින් සත්‍ය හා යථාර්තය ග්‍රහණය කර ගැනීමට හැකි මනුෂ්‍යයන් පිරිසක් වන නිසායි, අපි දැන් මේ මොහොතේ මේ ආකාරයට ජීවිතය ගත කරන්නේ.

පවුලේ අය, සමීප පුද්ගලයන් හෝ තමාට අසනීපයක් වු විට හෝ මිය ගිය විට සිතට දැඩි වේදනාවක් හා කණගාටුවක් දැනෙයි. එම දුක, කණගාටුව හා බිය හද පත්ලටම දැනෙන විට යථාර්තය දැකිමට හැකිවේ. ඒ ආකාරයට ඇතිවන දුක් වේදනාවන් තුලින්, දුකින් මිදීමේ දිශානතිය අපට පෙන්වාදෙයි.

'දුකින් මිදීම' යනු, උදාහරණයක් ලෙසට ජීවිතයේ ප්‍රශ්න ගැටළු වලින් ආගාධයට වැටී සිටින අවස්ථාවක වුවද, තම ජීවිතයේ අරුථ හා  අරමුණ මතකයට නගාගෙන, ධනාත්මක සිතුවිලි ඇතිකරගෙන කටයුතු කිරීමයි.

දුකින් මිදීම හා ජීවිතයේ අරමුණ ලෙස ඉහත සඳහන් කළත්, ගැඹුරින් කළ කල්පනා කළ යුතු නොවේ. උදුරණක් ලෙස, ආහාර පිළියෙළ කරන විට උපරිමයෙන් රසට ඉවීම, සිනහා මුසු මුහුණින් ආචාර කිරීම ආදී, තමාට සතුටින් කළ හැකි දේ තුලින් අවට සිටින අයටද සතුටක් ගෙනදෙයි. ඒ ආකාරයේ දේවල් ජීවිතයට අරුතක් හා අරමුණ ගෙනදෙන හරයන් බවට පත් වනවා නොවේද.

ජර්මනියේ නාසි  හමුදාවේ සිටි මනෝ චිකිත්සකයෙකු වු, වී.ඊ. ෆැන්කල් මහතා 'මනුෂ්‍යයන් කළ යුත්තේ, ජීවිතයේ අරමුණ විමසා ප්‍රශ්න කිරීම නොව, ජීවිතයේ ඇතිවන ප්‍රශ්න වලට විසඳුම් සෙවීමයි' සේ සඳහන් කර ඇත. අපගේ දෛවය වෙනස් කිරීම කාටත් කළ නොහැකියි. නමුත් වැදගත් වන්නේ ජීවිතයේ ඇති වන සිදුවීම් එකින් එක භාරගෙන, ඒ හැම විටම ධනාත්මක සිතුවිලි ඇතිකරගෙන කටයුතු කිරීමයි.

ඒ තුලින් කරුණා කාරණා වටහා ගැනීමටත්, අවබෝධ කර ගැනීමටත් හැකියාව ලැබෙනවා සේම, ඒ ආකාරය නැවත නැවත කටයුතු කිරීම, ජීවිතය වේ. රියෝකන් නම් සෙන් ගුරුතුමා, 'ලෝකයේ තිබෙන දුක නම්, ධර්මය නොදන්නා පිරිස සිටීමයි' සේ පවසා ඇත. බෞද්ධයන් වන අපි, නිතරම අරමුණක් ඇතිව ජීවිතය ගත කිරීමට අවශ්‍ය ධර්මයෙන් පොහොසත්ය.

From *Kosei*, February 2020



# සෑම සියළුදෙනාගේම බුද්ධ ශක්තියට ගෞරව කරමින්



යෝශිහිසා යමමොතෝ මහතා
ජපානයේ අන්තර්ජාතික බෞද්ධ පරිෂදය, හිටපු ප්‍රධානී

*මෙම සෙප්පෝව 2019 නොවැම්බර් සම 10 වන දින දයිසෙයිදෝවේදී පැවැත්වූ,
මියොකෝ නගනුමා සම නිර්මාතෘ තුමියගේ ගුණානුස්මරණ වැඩසටහනේදී ඉදිරිපත් කරන ලද්දකි.*

මියොකෝ නගනුමා සම නිර්මාතෘ තුමියගේ, 130 වන ජන්ම දින ගුණානුස්මරණ උත්සවයේදී සෙප්පෝවක් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳ හදවතින්ම ස්තුතිවන්ත වනවා.

මේ වර්ෂයේදී මම 70 වන වියට පාතැබුවා. අද දිනට මම රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ රාජකාරි කිරීම ආරම්භ කර වසර 40 කට වැඩි වෙනවා. ඒ කාලය තුල, උත්තරීතර වු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීමට මාර්ගය පෙන්වූ, බුදුන් වහන්සේට, නික්යෝ නිවානෝ තුමාට, නිච්කෝ නිවානෝ තුමාට, මියොකෝ නගනුමා තුමියට හදවතින්ම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් යැයි සිතනවා.

මම අයිචි ප්‍රාන්තයේ, චිතා ප්‍රදේශයේ, මුහුද අසල ගමකයි හැදී වැඩුනේ. මගේ තාත්තා, 2 වන ලෝක යුද්ධයේදී දිවි ගලවා ගත් ජපන් හමුදාවේ සොල්දාදුවෙක්. නමුත් 2 වන ලෝක යුද්ධයේද විශාල සොල්දාදුවන් පිරිසකට ජීවිත අහිමි විය. යුධ පිටියෙන් දිවිගලවාගෙන ආ තාත්තා ඉතා ශක්තිමත් පුද්ගලයෙකි, කුඩා කාලයේ නිතරම තාත්තාගේ ගුටි බැට වලින් පහර කෑමට මට සිදුවුනා. මට වයස අවුරුදු 23 දී, මම ගේ තුලටම සිරවී සිටිමින් තත්තා ගැන වෛරයෙන් සිටියා.



*ජපානයේ, දයිසෙයිදෝවේදී සෙප්පෝව ඉදිරිපත් කරන
යමමොතෝ ශාඛා ප්‍රධානී තුමා*

ටිකෙන් ටික මගේ ශරීර ශක්තියද දුර්වල වී, තාත්තාගෙන් තිබෙන මේ කරදරයෙන් මිදීමට, ධර්මානුකූල පිළියමක් සොයන්නට සිතුවා. මුළින්ම ක්‍රිස්තියානි ආගමේ පියතුමෙකුගෙන් උපදෙස් ලබාගැනීමට සිතුවත්, ශරීර ශක්තියද දුර්වල වී තිබූ නිසා ළගම සිටින කෙනා හොඳ යැයි සිතා අම්මගෙන් උපදෙස් පැතුවා.

මගේ අම්මා, 1962 වර්ෂයේදී රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයට ඇතුල් වී තිබුනා. මම, ගේ තුලට වී සිටි කාලයේ, අම්මා චිතා ප්‍රදේශයේ ධර්ම ශාඛාවට කිහිපවතාවක්ම යාමට පෙළඹී සිටියා. මා ගැන කනස්සල්ලෙන් බොහෝ විට අම්මා, ශිබුචෝ සාන් සහ කියෝකයිචෝ සාන්ගේ උපදෙස් ගෙන තිබුණා යැයි සිතනවා. ඒ කාලයේ ශාඛා ප්‍රධානී ලෙස සිටි, මසඔ වකියා කියෝකයිචෝ සාන් මට, 'ගෙදර තාත්තා එක්ක ඉන්න කරදර නිසා, සතියක පමණ කාලයක් ධර්ම ශාඛාවේ නවතින්න එන්න' යැයි කීවා.

මමත් ගෙදර සිටීමට අකමැති නිසා, සතියකට ප්‍රමාණවත් වෙන්න ඇඳුම්ද ගෙන ධර්ම ශාඛාවට ගියා. එවිට චිතා ධර්ම ශාඛාව තාවකාලිකව ඉදිකළ ගොඩනැගිල්ලක්, සීතලෙන් මිදීමට එහි විශාල ගිනි උදුනක් තබා තිබුනා. මම ඒ අසල ගිණි තපිමින්, ධර්ම ශාඛාවේ තිබු විවිධ පොත් පත් කියවීම සිදුකළා. ටික දවසකින් කියෝකයිචෝ සාන්ගේ රියදුරු වශයෙන්ද, සාමාජිකයන්ට උදව් කරමින්ද, තරුණ කණ්ඩායමේ ක්‍රියාකාරකම් වලටද සහභාගි වීමට පටන් ගත්තා. නවාතැන් ගැනීම සතියක කාලයකට පොරොන්දු වුනත්, නොදැනීම අවුරුදු 3ක් ශාඛාවේ නැවතී කටයුතු කලා.

ඒ ආකාරයට අවුරුදු 26 වු මම, 'දෙමව්පියන්ට ස්තූතිවන්තවීම ගැන ඉගෙන ගෙන, තාත්තා සමඟද මින් ඉදිරියට හොඳින් කටයුතු කිරීමට ආත්ම විශ්වාසයක් ඇතිව, ගෙදරට යාමට කියොකයිචෝ සාන්ගෙන් අවසර පැතුවා'. එවිට, වකියා කියොකයිචො සාන්, 'මුලස්ථානයේ ගකුරින් යැයි පාසලක් තිබෙනවා එයට ඇතුල්වීමට විභාගය ලියන්න' යැයි කීවා. කෝසෙයි සංවිධානයේ ඉගැන්වීම් ඉගෙන ගැනීමට ගකුරින් පාසලට යන විභාගය ලිව්වා වුනත්, සමත්වීමට හැකි වුනේ නැහැ. 'තව පාරක් උත්සහ කර බලන්න' යැයි වකියා කියෝකයිචෝ සාන් කියා සිටියා. මම වගේ කෙනෙකුට පාස් වෙන්න බැහැනේ යැයි සිතමින්, අවුරුදු 3 ක් නොමිලයේ ආහාරපාන ලබාදුන් නිසා

අකමැත්තෙන් නැවතත් විභාහයට පෙනී සිටියා. දෙවන වතාවේ විභාගයෙන් සමත්වීමට අවස්ථාව උදව් වී, ගකුරින් පාසලට ඇතුලත්ව කෝසෙයි සංවිධානයේ රාජකාරි කිරීමට හැකිවුනා. එම ආශිර්වාදයෙනුයි අද මම මෙතන සිටින්නේ.

රාජකාරි කාලය තුල අවුරුදු 35 දී හවායි ධර්ම ශාඛාවේ කියෝකයිචෝ තනතුර ලැබ, අවුරුදු 10 ක් හවායි සාමාජිකයන් සමඟ ධර්මය පුරුදු පුහුණු සිදුකලා. හවායි වල මිලියන 1.1 ජනගහනයෙන්, ජපානයෙන් සංක්‍රමණය වු අය ලක්ෂ 30 ක් පමණ සිටිනවා. ඒ අතර ජපන් භාෂාව කථා කරන අය සිටිනවා සේම, පරම්පරා දෙක තුනක් ගිහින් තිබෙන ඉංග්‍රීසි පමණක් කථා කරන අයද සිටියා.

ඒ අය අතර, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවී මංමුලා වී බලාපොරොත්තු සුන් වී සිටින තරුණයන්, පවුලේ අය සමඟ පවත්වාගෙන ගිය කුකුල් ගොවිපල බංකොලොත් වී, ණය බරෙන් පීඩාවට පත් සාමාජිකයන්, ඇමරිකා ජාතිකයන් සමඟ විවාහ වී හවායි වලට සංක්‍රමණය වී ආවත්, අඹුසැමි සම්බන්ධතාවය හොඳින් පවත්වා ගැනීමට නොහැකි කාන්තාවන්ද විශාල ප්‍රමාණයක් සිටියා. මෙවන් සාමාජිකයන්ව දුකින් මුදවා ගන්නේ කෙසේදැයි සැම දිනකම කල්පනා කලා. එමෙන්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සජ්ඣායනා කරමින්, නික්යෝ නිවානෝ තුමා, නිච්කෝ නිවානෝතුමාගේ පොත් පත් කියවමින්, තෙදොරි, මිච්බිකි කටයුතු දිනපතා කලා. එක් දවසක් ධර්ම ව්‍යාප්තියට යනවිට 'තම බුද්ධ ශක්තිය අවබෝධ කරගෙන, සැම කෙනෙකුගේම බුද්ධ ශක්තියට ගෞරව කිරීම, බෝධි සත්ව මාර්ගයයි' යන නික්යෝ නිවානෝ තුමාගේ උපදේශයක් හදවතට බද්ධ වුනා.

'බුද්ධ ශක්තිය අවබෝධ කරගැනීම යනු කුමක්ද?' යැයි කල්පනා කල විට 16 වන පරිච්ඡේදය, තථාගතයන් වහන්සේගේ සදාතනික ජීවිතය පිළිබඳ විවරණයෙහි, 'සැදැහැයෙන් පිරිණු විට මිනිසුන්, ඍජු බවෙන් හා මුදු ගුණෙන්, තම දිවිය පරදුවට තබමින්, මුලු හදින් පතති දක්නට බුදුන්, එ විට සග ගණ ද සමගින්, ගිජු කුලු පව්වට මම වඩිනෙමි' සේ සඳහන් වේ.

'ඇත්තම නේද, මේ දයිසේදෝවේ තැන්පත් කර තිබෙන බුදුන් වහන්සේ, මාගේ හදවතේද සිටි යි. මාව ජීවත් කරවමින්, ධර්මය මග පෙන්වමින් සිටිනවා. මුලින්ම එම සදාතනික බුදුන් වහන්සේ වැඳ නමස්කාර කිරීම, බුද්ධ ශක්තිය අවබෝධ කරගැනීමට වැදගත් වේ' යැයි සිතා ගෞරවනීය හදවතින්, උදේ සිට සවස් වන තෙක් 'ආදී බුද්ධ සදාතනික මහා කාරුණික ශාස්තෘ වු ශාක්‍යමුණි බුදුන් වහන්සේ සරණ යමි' ලෙස වැඳ නමස්කාර කිරීම පුරුදු පුහුණු කලා. එසේ අවුරුදු 3 ක කාලයක් කරන විට, එක් දිනක් හදිසියේම, මාගේ හදවතේ සැබෑ බුදුන් වහන්සේගේ ජීවය වන බුද්ධ ශක්තිය ඇතිබව අවබෝධ කරගත්තා.

ඒවාගේම, සාමාජිකයන්ව දුකින් මුදවා ගැනීම තුලින් අවබෝධ කර ගැනීමට හැකිවු දෙය නම්, පවුලේ සැම කෙනෙක්ම, එකිනෙකා තුල තිබෙන බුදුන් වහන්සේගේ ජීවය වන බුද්ධ ශක්තිය ඇතිබව අවබෝධ කරගෙන, එකිනෙකාට ගෞරව කරමින් කටයුතු කලහොත්, ඇතිවන ඕනෑම ප්‍රශ්නයක් හා දුකක් ජයගෙන, දුකින් මිදීමට හැකි බවයි. බුදුන් වහන්සේගෙන් ලැබී තිබෙන පවුල තුල විශාල ආශිර්වාදයක් තිබෙන බව අවබෝධ වුනා.

එය අවබෝධ කරගෙන, හවායි වලින් නැවතත් ජපානයට පැමිණියෙමි. ඉන්පසු ජපානයේ, තොත්තොරි ධර්ම ශාඛාවේ අවුරුදු 4 ක්, මත්සුදෝ ධර්ම ශාඛාවේ අවුරුදු 7 ක්, මියතා ධර්ම ශාඛාවේ අවුරුද්දක් ශාඛා ප්‍රධානි ලෙස, සාමාජිකයන් සමඟ ස්තුතිවන්තව ධර්ම මාර්ගයේ ගමන් කලා.

එසේ කාලය ගත වෙමින් මට වයස 59 දී, දකුණු ආසියාවේ ශ්‍රී ලංකා ධර්ම ශාඛාවේ ශාඛා ප්‍රධානි තනතුරට පත් වුනා. ශ්‍රී ලංකාව, ජපානයේ හොක්කයිදෝ වලට වඩා කුඩා දූපතකි, ජන ගහණය මිලියන 20 කි. සිංහල, දෙමළ, මුස්ලිම් යන බහු වර්ගිකයන් ලංකාවේ ජීවත් වනවා. එසේම ඔවුන්ට වෙනස් වු භාෂාවන්ද තිබෙනවා. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි ලෙස මිශ්‍ර ආගම් සහිත රටක්.

අප සංවිධානයේ බොහෝ සාමාජිකයන්, සිංහල ථේරවාදී බෞද්ධයන් වේ. ශ්‍රී ලංකාවට බුදු දහම පැමිණියේ ක්‍රි.පූ. 300 යැයි කියවේ. ජපානයේ බුදුදහමට වඩා දිගු ඉතිහාසයක් හා සංස්කෘතියක් තිබෙනවා. ධර්ම ශාඛාවේ සාමාජිකයන්, පන්සල් සහ හාමුදුරුවන් වහන්සේලාව බොහොමයක් වැදගත් කොට සළකනවා. සාමාජිකයන් විශාල ප්‍රමාණයක් ඉංග්‍රීසි භාෂාවට වැඩිය සිංහල පරිහරණය කරන අයයි. කෙසේ වෙතත් 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය' හෝ 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අටුවාව' වැනි අප සංවිධානයේ ප්‍රධාන ග්‍රන්ථ සිංහල භාෂාවෙන් නැහැ. තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් සිංහලට පරිවර්තනය කල සූත්‍ර පොත පමණි.

කුමන ආකාරයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් සාමාජිකයන්ට කියාදෙන්නේද යැයි කනස්සල්ලට පත්වුනා. මෙතනදීත්, හවායි ශාඛා ප්‍රධානිව සිටි කාලයේ අවබෝධ කරගත් 'තමා තුල තිබෙන බුදුන් වහන්සේගේ ජීවය වන බුද්ධ ශක්තිය අවබෝධ කරගෙන, ගෞරව කිරීම' කියා දීමට තීරණය කලා. නිච්කෝ නිවානෝ තුමාගෙන්, උපාය කෞශල්‍යයක් වශයෙන් බුද්ධ ස්වභාවය යන වචනයට, බුදුන් වහන්සේගේ ජීවය වන බුද්ධ ශක්තිය යන නාමය භාවිතා කිරීමට අවසර ලැබුනා. 'සදාතනික බුදුන් වහන්සේ අපි සැම කෙනෙකුගේම හදවත තුල සිටිනවා. එම නිසා එම ජීවයට ගෞරව කරමින්, කෘතවේදී වෙමින්, සූත්‍ර සජ්ඣායනා කිරීමෙන් දුකින් මිදීමට හැකිවනවා. එය, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ වැදගත්ම කියා දීමයි' ලෙස දේශනා කලා.

එම ප්‍රායෝගික පුහුණුව, පවුලේ සැම කෙනෙකුගේම හද තුල සිටින බුදුන් වහන්සේට ගෞරව කරමින්, එකිනෙකාට කෘතවේදී වෙමින් කටයුතු කිරීම පවුලේ සාමයට රුකුලක් බවද කියා දුන්නා.

ඒ ආකාරයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් කියා දීමට පටන් ගත් විට, ශ්‍රී ලංකා ශාඛාවේ A සාන්, මා සමඟ අමනාප වී බැණ වදින්නට පටන් ගත්තා.

'යමමොතෝගේ ආකාර්යක්ෂමතාව  නිසා සාමාජිකයන් අඩු වෙනවා. කිසිම දෙයක් කිරීමට නොහැකි කියොකයිචෝ කෙනෙක්. මම නික්යෝ නිවනෝ තුමාගෙන් ශ්‍රී ලංකාවේ ධර්ම ව්‍යාප්තිය භාරගත් නිසා, මම තමයි ශ්‍රී ලංකා ශාඛාවේ නිර්මාතෘ. යමමොතෝ ඉක්මනට ආපසු යන්න. නැවත ලංකාවට ඇතුළු වෙන්න දෙන්නෙ නෑ' යැයි කියමින්, වැඩසටහනක් තිබෙන සෑම අවස්ථාවකම පැයකට වැඩි කාලයක් නින්දා අපහාස කිරීම සිදු කලා.

මීට පෙර මම, මගේ හදවතේ බුද්ධ ශක්තිය විශ්වාස කරමින්, අන් අයගේද බුද්ධ ශක්තියට ගෞරව කරමින් සිටි නිසා, කොපමණ නින්දා අපහාස කළත් A සාන්ගේ හදවතේ බුද්ධ ශක්තියට ගෞරව නොකරන තෙක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සත්‍යතාව ඔප්පු කිරීමට හැකියාවක් නැහැ. ලංකාවේ මාත් සමඟ සිටි බිරිඳ ජීවිත අනතුරක් වේ යැයි බිය වී, ජපානයේ බැංකුවකින් සේප්පුවක් කුලියට ගෙන, අන්තිම කැමති පත්‍රය තැන්පත් කර, අපිට කුමක් හෝ දෙයක් වුවහොත්, සේප්පුව විවෘත කර එය භාවිතා කරන්න යැයි දරුවන්ට පවසා තිබුණා. අවුරුදු 5කට ආසන්න කාලයක් මෙම තත්වය වෙනස් නොවී පැවතුනා. සෑම වසරකම 11 වන මස, විදේශීය කියෝකයිචෝලාගේ රැස්වීමට ජපානයට යන සෑම විටම නිචිකෝ නිවානෝ තුමාට මාගේ දුක පවසා සිටියා, ඒ සියළුම දේ අසා එතුමා මාව දිරිමත් කළා.

විදේශිය ධර්ම ශාඛාවන්, එම රටේ නීති රීති වලට අනුකූලව සංවිධානය ලියාපදිංචි කිරීම අත්‍යාවශය වේ. ථේරවාදි බුදුදහම ආරක්ෂා කරමින් පැමිණි ලංකාවේ, මහායාන බෞද්ධ සංවිධානයක් ලියාපදිංචි කිරීම අපහසුයි, එම නිසා අවුරුදු ගණනක් ගත වුනත් අප සංවිධානය ලියාපදිංචි කිරීමට හැකිවූවේ නැහැ. එම තත්වය තුල ජෙෂ්ඨ සාමාජිකයන්ගේද උදවුවෙන්, ආශ්චර්යක් ලෙස රිෂ්ෂො කෝසෙයි ධර්ම පදනම යන නමින්, බුදු දහම මුලික කරගෙන සමාජ සුභ සාධන කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීමට හැකිවිය.

එයින්, ශාඛාවේ නම වෙනස් යැයි A සාන් කෝපයට පත් වී, 'මම, රිෂ්ෂෝ කෝසෙයි කායි ශ්‍රී ලංකා ධර්ම ශාඛාව යන නමින් නිර්මාතෘ තුමාගෙන් ධර්ම ව්‍යාප්තිය භාරගත් නිසා, ඒ නමින් වෙනම කරගෙන යනවා.' යැයි පවසමින් ශාඛාවෙන් යන්නට ගියා.

ලංකා ශාඛාවේ සාමාජිකයන් හා ජේෂ්ඨ සාමාජිකයන් බොහොමයක් A සාන් විසින් හඳුන්වා දුන් අය විය. එම නිසා ඒ අය A සාන් සමග එකතු වේවි යැයි සිතා, මම 'අපි දෙන්නා විතරක් ඉතිරි වේවිද දන්නෑ, නමුත් නිචිකෝ නිවානෝ තුමාගේ අතින් පත් වීම ලබාගෙන පැමිණි නිසා, අපි දෙන්නා උත්සහයෙන් වැඩ  කරමු' යැයි  බිරිඳ සමඟ කතා බහ කර ගත්තා. කෙසේ නමුත් පුදුම සහගත ලෙස, සාමාජිකයන් මාත් සමඟ එක්වී කටයුතු කරන්නට වුනා. A සාන් මේ ගැන මහත් පුදුමයට පත් වුනා.

සිංහල භාෂාව බැරි මම, ධර්මය එක් එක් කෙනාට කියා දීමට හෝ තෙදොරි කිරීමට හැකියාවක් තිබුනේ නැහැ. නමුත් සාමාජිකයන්, අවුරුදු 5 ක පමණ කාලයක් මට නින්දා අපහාස කරමින් පැමිණි A සාන්ගේ බුද්ධ ශක්තියට ගෞරව කරමින් පැමිණි මාගේ ස්වරූපය බලා සිටියා යැයි සිතමි. දැන් කල්පනා කරන විට, A සාන්ගේ පිහිටෙන්, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සාරය ශ්‍රී ලංකාවේ සාමාජිකයන්ට කියාදීමට බුදුන් වහන්සේ ලබා දුන් අවස්ථාවක් යැයි සිතනවා. සදාතනික බුදුන් වහන්සේව තදින්ම විශ්වාස කරමින්, නිර්මාතෘ නික්යෝ නිවානෝ තුමා, නිචිකෝ නිවානෝ තුමාගෙත් ඉගැන්වීම් තුලින් සද්ධර්ම පුණ්ඩරීක සූතය තදින්ම විශ්වාස කරමින් හා පුරුදු පුහුණු වීමෙන් මේ ආකාරයේ කෘතවේදී දේ අත්විදීමට හැකියාවක් ලැබුනා යැයි විශ්වාස කරමි.

ලංකාවේ අය විශිෂ්ඨ ආකාරයට අසල්වැසියන්, නෑදෑ හිතමිතුරන් අතර බැඳීමක් තිබෙන නිසා සාමාජිකයගේ ගෙවල්, ධර්මය ඉගෙන ගන්නා ස්ථානයන් බවට පත් කර ගැනිමට අදහස් කලා. ඒ අනුව, පවුල් හෝසා තුලින් ධර්මය ඉගෙනීමට පවුල් හෝසා ධර්ම ව්‍යාප්තිය ආරම්භ කළා. දැන් ලංකාව තුල 90 දෙනෙක් පමණ හෝසා නායකයන් පත් වී සිටිනවා.

2017 වර්ෂයේ, කෝශෝ මැතිනියගේ ප්‍රධානත්වයෙන් නව ධර්ම ශාඛාවේ විවෘත කිරීම සිදු කළා. වසර 2600 පමණ ඉතිහාසයක් ඇති ථෙරවාදී බුදුදහමේ ප්‍රධාන සංධිස්ථානය වන ලංකාවේ, හාමුදුරුවන් වහන්සේලා 10 නමකගේ සූත්‍ර සජ්ඣායනය මැද සදාතනික බුදුන් වහන්සේගේ ප්‍රතිමාව, කෝශෝ මැතිනියගේ දෑතින් නිරාවරණය කළ අවස්ථාවේ, ඉමහත් සතුටකින් හා කෘතවේදීවයකින් හදවත පිරී ගියා.

මියොකෝ නගනුමා මැතිණිය 'රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය පදනම් කරගෙන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෝකය පුරා ව්‍යාප්ත වේ' යැයි දෙවියන්ගෙ ආරූඩයකින් පවසා සිටියා. වර්තමානයේ වැඩි වැඩියෙන් විදේශිකයන්, ජපානයේදී රැකියා කරමින්, ජපානයට සහය වන කාලයට පැමිණ තිබේ. ජපානයේ පදිංචි වී සිටින විදේශිකයන් තෙදොරි කිරීම තුලින්, ඔවුන්ගේම හොඳ යහළුවෙක් බවට පත් වෙමින්, මින් ඉදිරියටද ගිහි බෞද්ධයෙකු ලෙස ධර්ම පුරුදු පුහුණු කරමින් ආධ්‍යාත්මික දියුණුව ඇතිකර ගැනීමට අධිෂ්ඨාන කරමි.

බුදුන් වහන්සේ, නිර්මාතෘ නික්යෝ නිවානෝ තුමා, නිචිකෝ නිවානෝ තුමා, මියොකෝ නගනුමා මැතිනිය, වකියා කියොකයිචෝ සාන්, එමෙන්ම ඔබ සියළු දෙනාටත්, එමෙන්ම මෙවන් විශිෂ්ඨ ජීවිතයක් ලැබුණාටත් හදවතින්ම ස්තුතිවන්ත වෙමින් මාගේ සෙප්පෝව අවසන් කරමි.

බොහෝම ස්තුතියි.

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ

## සාරාංශය හා වැදගත් කරුණු

### සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
### 13 වන පරිච්ඡේදය, උත්සහය පරිච්ඡේදය (පෙර කොටස)

මෙම පරිච්ඡේදයේ මුල් කොටසෙහි සදහන් වන්නේ, බුදුන් වහන්සේගේ ගිහි කල ඇතිදැඩි කළ මව වූ, මහා ප්‍රජාපති ගෝතමියට හා භාර්යාව වූ යශෝදරාවට විවරණ ලබා දීමයි. අධ්‍යාපනයෙන්ද උසස්, පින් බලයෙන්ද මහිම, බුදුන් වහන්සේගෙන් සෘජුව ධර්මය ශ්‍රවණය කල මෙම දෙපලට විවරණ ලබා නොදී, මංජු ශ්‍රී බෝධිසත්වයන්ගෙන් ධර්මය ශ්‍රවණය කල නාග දියණියට කලින් විවරණ ලබා දුන්නේ මන්ද, පහත සදහන් කරුණු 2 හි ඒ ගැන සදහන් වේ.

#### පිරිසිදු හදවතින් නිහතමානීව ධර්මය භාර ගැනීම

පලවන කරුණ නම්, මීට පෙර පරිච්ඡේදයක සදහන් කල ආනන්ද හා රාහුල තෙරුණ්ගේ සිදුවීම හා සමානයි. බුදුන් වහන්සේව කුඩා කල සිට රැක බලාගත් සුළු මව හා භාර්යාව ලෙස සිට තම ලෙයින් දරුවෙකුද බිහිකල භාර්යාව ආදී වඩා සමීප අයට ධර්මය කියාදීමේ අසීරු බව මෙහිදී කියදේ.

නාග දියණිය හා මංජු ශ්‍රී බෝධිසත්වයන් මෙන් ගුරු ගෝල සබැඳියාවේදි ඉතා පහසුවෙන් ධර්මය දේශනා කිරීමට හා ධර්මය ඉගෙන ගැනීමට පහසු වුවත්, ධර්මය දේශනා කරන්නාගේ ඉතාම සමීප භාර්යාව හා මව වැනි අය සමග හැගීම් බද්ධ වී තිබෙන බැවින් ධර්මය ඉගෙන ගැනීම නියමාකාරයෙන් සිදු නොවීම සාමාන්‍යයි.

එම කරුණු පහද දීම සදහා වුවමනාවෙන්ම විවරණ ලබාදීම පමා කලා යැයි අවබෝධ කරගත හැකිය. ඒ හැර මෙම දෙපල, නාග දියණියට වඩා කිසිවිටකත් පහත් තත්වයක සිටියා නොවේ.

දෙවන කරුණ නම්, 'නිවැරදිව ධර්මය කියාදෙනවා නම්, කියා දෙන්නේ කවුරුන්ද යන්න ප්‍රශ්නයක් නොමැත. එසේම ධර්මය නිවැරදිව භාර ගන්නේ නම්, ඒ වෙනුවෙන්ද අධ්‍යාපන මට්ටම හෝ සිටිනා තත්වය අදාල නොවේ. ඕනෑම කෙනෙකුට සත්‍යාවබෝධය ලබා ගත හැකිය' ලෙස කියාදෙයි. බුදුන් වහන්සේගේ සෘජු ශ්‍රාවකයෙකු නොවුනද, අවුරුදු දහස් ගණනකට පසුව සිටින පුද්ගලයන්ද, කුමන රටක වුවද, පවුල් පසුබිම ආදි කිසිම දෙයක් අදාල නොවේ. පිරිසිදු හදවතින් නිහතමානීව ධර්මය භාර ගන්නේ නම්, දුකින් මිදීමට හැකියාව ලැබේ. එම කරුණ වර්තමානයේ ජීවත් වන අපට ඉතාමත් වැදගත් යැයි සිතමි.

#### බෝධිසත්වයන් වහන්සේලා විසින් ධර්මය ප්‍රචලිත කරන බවට ප්‍රතිඥා දීම

මෙම 'උත්සහය පරිච්ඡේදයේ' අන්තර්ගතය වන්නේ, 'දේවදත්ත පරිච්ඡේදයේදී', සෑම මනුෂ්‍යයෙකුටම එක හා සමාන ලෙස බුද්ධ ශක්තියෙන් යුතු බව අවබෝධ කරගත් බෝධිසත්වයන් වහන්සේලා, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මේ දක්වා වූ කියාදීම් ගැන සතුටට පත්වී, මෙම විශිෂ්ඨ වූ ධර්මය ජීවිතය පරදුවට තබා ආරක්ෂා කර, පුරුදු පුහුණු වෙමින්, අන්‍යයන්ට දේශනා කරමින් ප්‍රචලිත කරන අවට අධිෂ්ඨාන කිරීමයි.

මෙහි 'උත්සහය' යනු, 'ධර්මය පිළිගෙන කටයුතු කිරීමට දිරිගැන්වීම' වේ. නමුත් මෙම පරිච්ඡේදයේදී අන්‍යයන්ව දිරිගැන්වීම සදහා කිසිදු වදනක් සදහන් නොවේ, තමා විසින්ම අධිෂ්ඨානයක් ඇති කර ගැනීමට යොමු කර ඇත. අන්‍යයන්ව දිරිගැන්වීමට නම්, මුලින්ම තමා දැඩිව අධිෂ්ඨානයක් ගොඩනගා ගත යුතුය. ඒ අනුව තමා විසින් ධර්ම පුහුණුවේ නොයෙදී අන්‍යයන්ට මග පෙන්වීමට නොහැකි නිසා මේ පරිච්ඡේදයේ නම වන 'උත්සහය' යන්නෙහිද ගැඹුරු අරුථක් ඇත.



# *Director's Column*

## ජීවිතයේ අරුථ යනු

පෙබරවාරි යනු, ජපානයේ බුදුන් වහන්සේගේ පරිණිර්වානය සමරණ මාසයයි. මේ මස නිචිකෝ නිවානෝ තුමාගේ මාසික පණිවුඩයේදී බුදුන් වහන්සේ තම පරිණිර්වානය තුලින්, ජීවයක් තිබෙන සෑම කෙනෙකුම අනිවාර්යයෙන්ම මරණයට පත්වීමේ, යථාර්තය පෙන්වාදෙයි. එසේම, ධර්මාචාර්යතුමෙක පරිච්ඡේදයේදී 'ප්‍රාර්ථනා කරගෙන මෙලොවට බිහිවීම' හීදී මනුෂ්‍යයෙකු ලෙස ලබන මෙම ජීවිතයේ අරුතක් තිබෙන බවද කියාදෙයි.

ජීවිතයේ අරුථ යනු, තමාට ලැබී තිබෙන වගකීම් අවබෝධ කරගෙන ඒ වෙනුවෙන් උපරිම කැපවීමෙන් කටයුතු කර, අවට සිටින්නාවු පුද්ගලයන්ව සතුටට පත් කිරීමයි.

අප සංවිධානයෙන් මෙහෙයවන, 'සිහින මල්ල' නම් ස්වෙච්ඡා වැඩසටහනට සහභාගී වු කුඩා පාසල් දරුවෙක් සිටියා. ඔහුට කෘතිම ඇසක් බද්ධ කර තිබු නිසා, දීර්ඝ වේලාවක් සිටින විට ඇසට ඉතා වේදනාවක් දැනෙනවා. නමුත් මෙම 'සිහින මල්ල' බෙදා දීමේ වැඩසටහනට සහභාගී වී යුද්ධයෙන් අසරණ වු දරුවන් සමඟ කටයුතු කරන විට, කෘතිම ඇසේ රිදීමක්වත් නොමැතිව කටයුතු කිරීමට හැකිව තිබුණා. මේ මොහොතේ තමාට කළ හැකි වන්නේ එවැනි ස්වෙච්ඡා කටයුතු පමණයි යැයි සිතා, කැපවීමෙන් කටයුතු කල ඔහුගේ ස්වරූපය ඉතා විශිෂ්ඨ විය. වෙනස් කළ නොහැකි දෛවය තමා අභිමුවෙහි තිබුණත් ධනාත්මක සිතුවිලි වලින් ජීවත්වීමේ වැදගත්කම ඔහුගෙන් ඉගෙන ගැනීමට හැකියාව ලැබුණා.



අපි ප්‍රාර්ථනා කර ලබාගත් මේ ජීවයෙන්, ඉතා දිප්තිමත්ව උපරිම කැපවීමෙන් කටයුතු කරමු.

කෝයිචි සයිතෝ මහතා
ප්‍රධානී, අන්තර්ජාතික මුලස්ථානය, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212FAX: 1-808-455-4633
Email: info@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
POBox 33636, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, USA
POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 FAX: 1-650-359-6437
Email: info@rksf.org URL: http://www.rksf.org

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809 Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-262-4437
Email: info@rkina.org URL: http://www.rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692042, San Antonio, TX 78269, USA
TEL: 1-210-561-7991 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 FAX: 1-253-945-0261
Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

Facebook: https://www.facebook.com/rishokosseikaidobrasil
Instagram: https://www.instagram.com/rkkbrasil

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP, CEP 08730-000, Brasil

**在家佛教韓国立正佼成会**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571 FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571 FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633 FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會**
台湾台南市崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478 FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059, West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rumpur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141 FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216 FAX: 66-2-716-8218 Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406 FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL/FAX: 880-31-626575

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh
**Rissho Kosei-kai Patiya**
China Clinic, Patiya Sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni,**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Dhaka**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar, Ramu Shibu**

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960 Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
2F Ikh Mandal building, Khurenbulag bag, Bayan-Undur sum,
Orkhon province, Mongolia

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949 Email: roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230 FAX: 03-5341-1224 URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**